12
පාඩම
एकादशः पाठः।

# किं त्वं वाचालोऽस्मि ? अहं वाचालो नास्मि ।

**III.** අස්ත්‍යර්ථ තද්ධිතය

**किं त्वं धनिकोऽसि ? नाहं धनिकोऽस्मि ।** (ඔබ ධනවතෙක් ද? නැත මම ධනවතෙක් නොවෙමි).

**धनिकः** යනු ධනය ඇති තැනැත්තා ය. **धनं अस्य अस्ति । -** (ධනය මොහුට ඇත) යන පද කිහිපය සංක්ෂිප්ත කොට **धनिक** ලෙස සකස් කෙරේ. ඇති බව අඟවනු ලබන්නේ '' **इक**'' යන ප්‍රත්‍යය එකතු වීමෙනි.

धनं अस्य अस्ति
धनं = ධනය

+ इक යනු ''අයත් ය සහ ඇත්තේ ය'' යන තේරුම සහිත ප්‍රත්‍යයකි.

धनं + इक >

धन + इक = ''ධනය ඇත්තේ ය'' යන තේරුම සහිත ප්‍රකෘතිය හා ප්‍රත්‍යය යි.

धनिक = යනු ''ධනය ඇත්තා'' යන තද්ධිත පදය යි.

මෙලෙස ධනය ඇති තැනැත්තා, වාසනාව ඇති තැනැත්තා යනාදි පද **ධනවත්, භාග්‍යවත්** වශයෙන් තනිපද ලෙස සිංහල භාෂාවෙහි ව්‍යවහාර කෙරේ. සංස්කෘත භාෂාවෙහි ද **ධනවාන්, භාග්‍යවාන්** ආදි ලෙස යෙදේ.

| සිංහල | | संस्कृत |
|---|---|---|
| ශ්‍රමික | - | श्रमिक |
| බුද්ධික | - | बुद्धिक |
| ගුණවත් | - | गुणवत् |

| | | |
|---|---|---|
| ශ්‍රීමත් | - | **श्रीमत्** |
| ජටිල | - | **जटिल** |
| වාචාල | - | **वाचाल** |
| මධුර | - | **मधुर** |

යනාදි ලෙස භාවිත වනුයේ ද සංස්කෘත භාෂාවෙහි **අස්ත්‍යර්ථ තද්ධිත** ලෙස හඳුන්වනු ලබන නාමපදයන් ය.

අස්ත්‍යර්ථ තද්ධිතයේ බහුල ව යෙදෙන ප්‍රත්‍යය කිහිපයක් හා ඊට අදාළ උදාහරණ පහත දැක්වේ. ඒවා මැනවින් අධ්‍යයනය කරන්න.

**අස්ත්‍යර්ථ තද්ධිත පද සාධනයේ දී,**

इक इन अण् इन् विन् वत् मत् र ल आल लु आलु इल वल ऊल

**इक** ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| धन + इक | = | धनिक | > | धनिकः | (ධනය ඇති) |
| श्रम + इक | = | श्रमिक | > | श्रमिकः | (ශ්‍රමය ඇති, ශ්‍රමය කැපකරන) |
| बुद्धि + इक | = | बुद्धिक | > | बुद्धिकः | (නුවණ ඇති) |

**इन** ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| फल + इन | = | फलिन | > | फलिनः | (ගෙඩි ඇති) |
| मल + इन | = | मलिन | > | मलिनः | (කිළිටි ඇති) |
| बर्ह + इन | = | बर्हिण | > | बर्हिणः | (පිල්කලඹ ඇති, මොනරා) |

**अण्** ප්‍රත්‍යය (මෙහි **ण्** කාරයට මූලස්වර වෘද්ධිය වන බව සැලකිය යුතුයි).

| | | | | | |
|---|---|---|---|---|---|
| प्रज्ञा + अण् | = | प्राज्ञ | > | प्राज्ञः | (ප්‍රඥාව ඇති) |
| श्रद्धा + अण् | = | श्राद्ध | > | श्राद्धः | (ශ්‍රද්ධාව ඇති) |
| अर्चा + अण् | = | आर्च | > | आर्चः | (ප්‍රජාව ඇති) |

इन् ප්‍රත්‍යය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| धन | + इन् | = | धनिन् | > | धनी | (ධනය ඇති) |
| सुख | + इन् | = | सुखिन् | > | सुखी | (සැප ඇති) |
| रोग | + इन् | = | रोगिन् | > | रोगी | (රෝග ඇති) |

विन् ප්‍රත්‍යය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| मेधा | + विन् | = | मेधाविन् | > | मेधावी | (නුවණ ඇති) |
| तपस् | + विन् | = | तपस्विन् | > | तपस्वी | (තපස ඇති) |
| तेजस् | + विन् | = | तेजस्विन् | > | तेजस्वी | (තේජස ඇති) |

वत् සහ मत् ප්‍රත්‍යය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| धन | + वत् | = | धनवत् | > | धनवान् | (ධනය ඇති, ධනවත්) |
| गुण | + वत् | = | गुणवत् | > | गुणवान् | (ගුණ ඇති, ගුණවත්) |
| भग | + वत् | = | भगवत् | > | भगवान् | (භාග්‍යය ඇති, භාග්‍යවත්) |
| प्रीति | + मत् | = | प्रीतिमत् | > | प्रीतिमान् | (සතුට ඇති, ප්‍රීතිමත්) |
| श्री | + मत् | = | श्रीमत् | > | श्रीमान् | (ශ්‍රියා ඇති, ශ්‍රීමත්, උදාර) |
| ह्री | + मत् | = | ह्रीमत् | > | ह्रीमान् | (ලජ්ජා ඇති, ලජ්ජිත) |

र ප්‍රත්‍යය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| मधु | + र | = | मधुर | > | मधुरः | (මිහිරි බව ඇති) |
| मुख | + र | = | मुखर | > | मुखरः | (මුකරි බව ඇති, කට ඇති) |
| कुञ्ज | + र | = | कुञ्जर | > | कुञ्जरः | (හනුවක් ඇති, ඇතා) |

ल සහ आल ප්‍රත්‍යය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| चूडा | + ल | = | चूडाल | > | चूडालः | (කරමලයක් ඇති, කුකුළා) |
| शिखा | + ल | = | शिखाल | > | शिखालः | (ශිඛාවක් ඇති, මොනරා) |
| अंस | + ल | = | अंसल | > | अंसलः | (පිරුණු උරහිස් ඇති) |
| वाच् | + आल | = | वाचाल | > | वाचालः | (බොහෝ වචන ඇති, වාචාල) |

लु ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| कृपा | + लु | = कृपालु | > कृपालुः | (කරුණාව ඇති, කාරුණික) |
| दया | + लु | = दयालु | > दयालुः | (දයාව ඇති) |
| श्रद्धा | + लु | = श्रद्धालु | > श्रद्धालुः | (ශ්‍රද්ධාව ඇති) |

आलु ප්‍රත්‍යය

| | | | | |
|---|---|---|---|---|
| शीत | + आलु | = शीतालु | > शीतालुः | (අධික ශීතල ඇති) |
| उष्ण | + आलु | = उष्णालु | > उष्णालुः | (අධික උෂ්ණය ඇති) |
| कृष्ण | + आलु | = कृष्णालु | > कृष्णालुः | (අධික කලුපැහැ ඇති) |

इल ප්‍රත්‍යය

| | | | | |
|---|---|---|---|---|
| फेन | + इल | = फेनिल | > फेनिलः | (පෙනගොබයක් ඇති, නයා) |
| उरस् | + इल | = उरसिल | > उरसिलः | (පුළුල් උරස්තල ඇති, විසල් පපුව ඇති) |
| सिकता | + इल | = सिकतिल | > सिकतिलः | (වැලි ඇති, වැලි විසිරුණු) |

वल ප්‍රත්‍යය

| | | | | |
|---|---|---|---|---|
| कृषि | + वल | = कृषीवल | > कृषीवलः | (කෘෂි කටයුතු ඇති, ගොවියා) |
| परिषद् | + वल | = परिषद्वल | > परिषद्वलः | (පිරිස ඇති) |
| शत्रु | + वल | = शत्रुवल | > शत्रुवलः | (සතුරන් ඇති) |

ऊल ප්‍රත්‍යය

| | | | | |
|---|---|---|---|---|
| वात | + ऊल | = वातूल | > वातूलः | (වාත රෝග ඇති) |
| बल | + ऊल | = बलूल | > बलूलः | (බලය ඇති) |
| दन्त | + ऊल | = दन्तूल | > दन्तूलः | (දළ ඇති, ඇතා) |

## අභ්‍යාසය 12.1

01. ගුරුවරයාගේ සහාය ඇති ව වරහන් තුළින් සුදුසු නාමපද තෝරා පහත වගුවේ ප්‍රත්‍යය අනුව වර්ග කරන්න.

(दन्तावल / श्रद्धावान् / शीतालुः / यशस्वान् / शिखावलः / पिच्छिलः / श्राद्धः / छत्रिकः / मालिकः / पयस्वान् / शुशिरः / श्रुतवान् / धृतिमान् / तुण्डिलः / तपस्वी / पेनलः / पयस्वी / रूपिकः / मायालुः / कृपालुः / आयुष्मान् / रुचिरः / चक्षुमान् / यशस्वी / श्वेतालुः)

| वत् | मत् | इल | वल | इक | आलु | अण् | इन | विन् | लु |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. පහත දැක්වෙන තද්ධිත පදවල තේරුම් ලියන්න.

०१. सुखिन् ..............................

०२. आर्थिन् ..............................

०३. कुमुदुनी ..............................

०४. रसवान् ..............................

०५. तेजस्वी ..............................

०६. मायिकः ..............................

०७. दृष्टवान् ..............................

०८. बन्धुमान् ..............................

०९. कुञ्जरः ..............................

१०. नगरः ..............................

११. कुलिनः ..............................

१२. मांसलः ..............................

१३. उदकालुः ..............................

१४. दन्तूलः ..............................

१५. तुण्डिलः ..............................

१६. बर्हिणः ..............................

## IV. සමූහාර්ථ තද්ධිතය

अथ कदाचित्तत्रानुषङ्गिकं वानरयूथमितश्चेतश्च परिभ्रमदागतम्।

**(කිසියම් වඳුරු රැළක් ඒ මේ අත ඇවිදිමින් පිළිවෙළින් එතැනට පැමිණියහ.)**

● වඳුරු රැළක් යනු ඉරි ඇඳි පදයෙහි තේරුමයි. රංචුව, රැළ, රළ, රැන, පොකුර, පන්තිය, වර්ගය, කැළ යනාදි පද සමූහයක් හැඳින්වීම සඳහා සිංහල භාෂාවෙහි යෙදෙන තනි පදයන් ය.

**यूथ - राशि - षण्ड - वर्ग - समूह - गण - वृन्द** යනාදි පද සමූහාර්ථය ඇඟවීම සඳහා සංස්කෘත භාෂාවෙහි යෙදෙන පද කිහිපයකි. සමූහාර්ථය ඇඟවීම සඳහා **ता - या - इनी - त्रा - अण् - यण् - कण् - इकण्** යනාදි ප්‍රත්‍යය යෙදේ.

**जनानां समूहः - जनसमूहः ( समास)**
**जनानां समूहः - जनता (तद्धित)**

ජනතා යනු මිනිසුන්ගේ එකතුවයි. සමූහය යනාර්ථය සඳහා - තා - යන ප්‍රත්‍යය යෙදී ඇත. එලෙස තනා ගනු ලබන නාමපද සමූහාර්ථ තද්ධිත නමින් හැඳින්වේ.

● ඉහතින් දැක්වුණු සමූහාර්ථවාචී ප්‍රත්‍යයන් ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් පරව යෙදී පද සාධනය වේ.

**ता या इनी त्रा अण् यण् कण् इकण्**

### අභ්‍යාසය 12.2

01. උදාහරණයට අනුව සුදුසු ප්‍රත්‍යය යොදා නාමපද සකසන්න.

උදා:- **ජනානාං සමූහඃ** - මෙහි ෂෂ්ඨී විභක්ති අන්තය ලොප් වේ. එවිට - ජන - යන්න පමණක් ශේෂ වේ. සමූහාර්ථය ලබා දෙන - තා - ප්‍රත්‍යය එකතු කෙරේ. එවිට ජනතා යන්න තැනේ.

१. सहायानां समूहः - ............................................... ( ता )
२. पाशानां समूहः - ............................................... ( या )
३. वातानां समूहः - ............................................... ( या )

४. गवां समूहः - ............................................... ( त्रा )
५. भिक्षाणां समूहः - ............................................... ( अण् )
६. युवतीनां समूहः - ............................................... ( अण् )
७. केदाराणां समूहः - ............................................... ( यण् )
८. धेनूनां समूहः - ............................................... ( कण् )
९. कवचानां समूहः - ............................................... ( इकण् )
१०. बन्धूनां समूहः - ............................................... ( ता )

सुतप्तमपि पानीयं शमयत्येव पावकम्।
සුතප්තමපි පානීයං ශමයත්‍යෙව පාවකම්
වතුර උණුකළත් ගින්න නිවයි.

हितं मनोहारी च दुर्लभं वचः।
හිතං මනෝහාරී ච දුර්ලභං වචඃ
හිතවත් හා මිහිරි වචන දුර්ලභ ය.

हतः सैन्यमनायकम्।
හතං සෛන්‍යමනායකම්
නායකයෙක් නැති සේනාව විනාශ වේ.